# <u>ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ</u>
# <u>නිශ්චල ඡායාරූප ශිල්පී සහ කැමරා ක්‍රියාකරු (වීඩියෝ) තනතුරු සඳහා</u>
# <u>තාවකාලික පදනම මත බඳවා ගැනීම සඳහා අදාළ පරිපාටිය</u>

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : -

1.2 අමාත්‍යාංශය : ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
යොමු අංකය : MDM/AD/HB/SOR දිනය : 2011.09.14

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :
යොමු අංකය : DMS/B03/12 දිනය : 2012.08.14

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය : EST-3/RECRU/03/4022 දිනය : 2011.07.19

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NSCC/2/12/SR-1 දිනය : 2011.10.18

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය : PSC/EST/3/1/19/2012 දිනය : 2012.10.25

02. පත්කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්

03. පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයන්හි විධායක කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා / හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් විශේෂී තාක්ෂණික නිපුණතාවයන්, එනම් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) මට්ටම 5 යටතට ගැනෙන්නාවූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා හිමිකර ගත යුතු නිපුණතා අවශ්‍ය වන කාර්යයන් මෙම නිලධර ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් අමාත්‍යාංශ ලේකම් විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම නිලධර ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

04. තනතුරේ ස්වභාවය : මෙම තනතුර තාවකාලික තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබාගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

05. මාසික දීමනාව : දීමනාවක් ලෙස මාසිකව රු. 14,425/- ක් හිමි වේ.

06. තාවකාලික පදනම යටතේ බඳවාගැනීමට අනුමත තනතුරු හා අනුමත තනතුරු සංඛ්‍යාව

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| නිශ්චල ඡායාරූප ශිල්පී | 01 | 1.නිශ්චල ඡායාරූප ගැනීම හා මුද්‍රණය<br><br>2.මුද්‍රණ හා ඡායාරූප රසායනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු<br><br>3.ඡායාරූප ලේඛනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු<br><br>4.ඡායාරූප ලේඛන පවත්වාගෙන යාම හා සුචිගත කිරීම<br><br>5.ඡායාරූප අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩා භාරව කටයුතු කිරීම<br><br>6.ඇස්තමේන්තු සකස් කිරීම<br><br>7.ෆොටෝ ගෙමිටු ක්‍රමයට ඡායාරූප ගැනීම හා ඩිජිටල් ක්‍රමයට අනුව ඡායාරූප ගැනීම<br><br>8.පරිගණක ආශ්‍රිත මුද්‍රණය හා ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |
| කැමරා ක්‍රියාකරු | 01 | 1.වීඩියෝ කිරීම විශේෂ වැදගත්කමකින් යුතු අවස්ථා රූපගත කිරීම හා සංස්කරණය<br><br>2.සංස්කරණ උපකරණ හා සංස්කරණ මැදිරිය භාරව කටයුතු කිරීම හා එහි නඩත්තු කටයුතු<br><br>3.වීඩියෝ පට ලේඛනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු<br><br>4. වීඩියෝ පට ලේඛනයක් පවත්වාගෙන යාම හා සුචිගත කිරීම<br><br>5.වීඩියෝ අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩා භාරව කටයුතු කිරීම<br><br>6.ඇස්තමේන්තු සකස් කිරීම<br><br>7.ඕනෑම වර්ගයකට අයත් කැමරාවක් පරිහරණය කිරීම, ඩිජිටල් ක්‍රමයට අනුව රූප රාමු ලබා ගැනීම හා සකස් කිරීම<br><br>8.පරිගණක ආශ්‍රිත මුද්‍රණය හා ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |

07. තාවකාලිකව බඳවා ගැනීමේ සුදුසුකම් :

7.1 අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී ගණිතය සහ සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 04 කට අවම වශයෙන් සම්මාන සහිතව එක් වරකදී විෂයයන් 06 ක් සමත්ව තිබීම.

7.2 වෘත්තීය සුදුසුකම් : තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා NVQ 5 මට්ටමට ඇතුළත් වන්නා වූ තාක්ෂණික පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

7.3 පළපුරුද්ද : අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ

7.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.5 වෙනත් : I ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය
II අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය
III තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

08. වයස :
8.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු
8.2 උපරිම සීමාව : අවුරුදු 35 ට නොවැඩි

09. බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණයකින්
9.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේදීම සහතික පත්‍ර පරීක්ෂා කරනු ලැබේ.

| පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 35 | අදාළ නොවේ |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 15 | |
| පළපුරුද්ද | 20 | |
| භාෂා ප්‍රවීණතාවය | 10 | |
| තොරතුරු තාක්ෂණය / පරිගණක විද්‍යාව පිළිබඳව ලබා ඇති සුදුසුකම් | 15 | |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය, පෞර්ෂය හා සන්නිවේදන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

9.2 ප්‍රායෝගික පරීක්ෂණය :

| පරීක්ෂා කර ලකුණු ලබාදෙන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
| --- | --- | --- |
| (අ) නිශ්චල ඡායාරූප ශිල්පී තනතුර<br><br>• කැමරාවක් ක්‍රියාකරවීම හා රූපගත කිරීම<br>• ආලෝකය සැපයීම හා නවීන තාක්ෂණික ක්‍රම භාවිතය<br>• පැහැදිලි ඡායාරූප ගැනීම | <br><br>60<br>20<br>20 | <br><br>40% |
| එකතුව | 100 | |
| (ආ) කැමරා ක්‍රියාකරු (වීඩියෝ) තනතුර<br><br>• වීඩියෝ කැමරා හා ඊට අදාළ උපකරණ ක්‍රියාකරවීම<br>• ප්‍රවෘත්ති ආවරණයට සුදුසු පරිදි දර්ශන තෝරා ගැනීම හා දත්ත එක්රැස් කිරීම<br>• රූපවාහිනී දර්ශන වලට අදාලව ස්වභාවික ආලෝකය උපයෝගී කර ගැනීම හා රූගත කිරීම සඳහා විදුලි ආලෝකය යෙදීම<br>• පරිගණක තාක්ෂණය භාවිතයෙන් ප්‍රවෘත්ති සංස්කරණය පිළිබඳ හැකියාව<br>• කැසට් පට පටිගත කිරීමේ තාක්ෂණය හා ඊට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම<br>• රූපවාහිනී මැදිරි තුළ රූගත කිරීම පිළිබඳ සාමාන්‍ය දැනුම | <br><br>30<br>20<br><br>20<br><br>10<br><br>10<br><br>10 | 40% |

සටහන - ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් ලකුණු ලබා ප්‍රායෝගික පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය යන දෙකෙන්ම ලබාගත් මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙලින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවාගනු ලැබේ.

9.2.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත් කරන බලධරයා : ලේකම්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

හා / හෝ

9.2.2 ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : ලේකම්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

9.3 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

සකස් කළේ : අත්සන : ...................... 12.11.08
(විෂයභාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ...................... කේ. එච්. එම්. සංජය
සහකාර ලේකම් (පාලන)
තනතුර : ...................... ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
විද්‍යා මාවත
කොළඹ - 07.
දිනය : 2012.11.08 ......................

පරීක්ෂා කළේ :අත්සන ......................
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ...................... ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
තනතුර : ...................... විද්‍යා මාවත
කොළඹ - 07.
දිනය : 2012/11/08 ......................

නිර්දේශ කර ඉදිරිපත් කරමි.
අත්සන : ......................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ......................
තනතුර : ...................... වසන්තා සමරවීර
අතිරේක ලේකම්
නිලමුද්‍රාව : ...................... ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
විද්‍යා මාවත
කොළඹ - 07.

දිනය : 2012/11/12 ......................

යොමු අංකය - MDM/AD/HB/SOR

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙහි නිශ්චල ඡායාරූප ශිල්පී සහ කැමරා ක්‍රියාකරු (වීඩියෝ) තනතුර සඳහා යෝජිත මෙම තාවකාලික පදනම මත බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ......................
නම : ...................... එස්. එම්. මොහොමඩ්
ලේකම්
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
ලේකම්
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

දිනය : 12.11.12 ......................
නිලමුද්‍රාව : ......................

යොමු අංකය : PSC/EST/3/1/19/2012 ......................

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙහි නිශ්චල ඡායාරූප ශිල්පී සහ කැමරා ක්‍රියාකරු (වීඩියෝ) තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2012-10-25 ...................... දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ......................
නම : ......................
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2012.12.14 ......................
නිල මුද්‍රාව : ......................
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට
කොළඹ-05.